# අභිප්‍රේරණයේ මනෝවිද්‍යාත්මක පසුබිම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට දක්වන දායකත්වය

- අම්පේ විමලධම්ම හිමි

## හැඳින්වීම

අභිප්‍රේරණය මානවයාගේ ආරම්භයේ සිටම ජීව විද්‍යාත්මක සංවර්ධනයේ අංශයක් ලෙස ද ජීවිතයේ වෙනත් සියලුම අංශයන් සමඟ ද සම්බන්ධ වන්නකි. මානව ශිෂ්ටාචාරය දෙස බැලීමේදී යුගයෙන් යුගය පියවරෙන් පියවර ඉදිරියට සංවර්ධනය සඳහා හේතු වන්නේ අභිප්‍රේරණයයි. වර්තමාන ලෝකයේ තාක්ෂණික හා විද්‍යාත්මක දියුණුව දෙස බලන විට මේ බව වඩාත් හොඳින් තහවුරු වේ. යම් කිසි කාර්යක කාර්ය ය සාඵල්‍යය සඳහා අභිප්‍රේරණය ඉතා වැදගත් වේ. පුද්ගලයෙකුගේ සාර්ථකත්වය සඳහා අභිප්‍රේරණය ඉතා වැදගත් සාධකයකි. මිනිසාගේ සියලු චර්යාවන්ට දිරිගැන්වීම් කරනු ලබන සියලු දෙයක් ම අභිප්‍රේරණය ලෙස සරලව හඳුන්වා දිය හැකිය. මෙය පුද්ගලයෙකු තුළ සිදුවන මානසික ක්‍රියාලියකි. එම මානසික ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා එම පුද්ගලයාට පරිබාහිරව පවතින සමාජ, සංස්කෘතික හා පුද්ගල සාධක ඉවහල් වේ. ඒ අනුව පුද්ලයාගෙන් පරිබාහිරව පවතින සාධක හා මානසික සාදක ද්වයේ සම්බන්ධතාවක් අභිප්‍රේරණය තුළ දැකිය හැකිය.

මනෝවිද්‍යාඥයන්ට අනුව අභිප්‍රේරණය යනු යම්කිසි චර්යාවකට ශක්තිය සම්පාදනය කරනු ලබන බලවේගයකි. පෙළඹවීම යම්කිසි පුද්ගලයෙකු තුළ පවතින්නේ කුමන ආකාරයෙන්ද හා කුමන මට්ටමෙන් ද යන්න නිශ්චිතව කීම



දුෂ්කරය. ඊට හේතුව එය මානසික හැකියාවක් වන නිසාය. මානසික හැකියාවන් මැණීම සිදු කරන්නේ ඊට අදාළ චර්යාවන් මගිනි. එසේ හෙයින් අභිප්‍රේරණය චර්යාවන් නිරීක්ෂණය මගින් අනුමාන වශයෙන් මැනගත හැකිය. එය වෙනත් බාහිර බලපෑමක් නිසා සිදු කරනු ලබන චර්යාවක් නොව පුද්ගලයා ස්ව කැමැත්තෙන්ම සිදු කරනු ලබන චර්යාවක් වීම වඩා වැදගත් වේ. ඊට හේතුව අභිප්‍රේරණය ස්වයං ලෙස මනසේ හටගන්නා ක්‍රියාවලියක් වන නිසාවෙනි.

## අභිප්‍රේරණය නිර්වචනය කිරීම

අභිප්‍රේරණය යන්නෙහි ඉංග්‍රීසි වචනය “Motivation” ලතින් භාෂවේ “Moveers” යන මූලයෙන් බිඳී ආවකි. “Moveers” යන්නෙහි අර්ථය ඉදිරියට යාම වැන්නකි. මේ නිසා “Motivation” යන්නෙහි සිංහල අර්ථය ජීවියා ඉදිරියට යාම සඳහා ක්‍රියාත්මක වන බලවේගයක් යන්න ඇඟවේ.[1] ඒ අනුව අභිප්‍රේරණය යනු වචනාර්ථය දෙස බැලීමේදී ඉදිරියට යාම යන අර්ථය එහි ගැබ් වේ. එහි සැබෑ අර්ථය වන්නේ ඉදිරියට යාමට අවශ්‍ය ශක්තිය සපයන මානසික බලවේගය යන්නයි. ඒ අනුව ඉතා සියුම් අර්ථයෙන් විමසන කළ අභිප්‍රේරණය යන්න මනසේ ඇතිවන සිතිවිල්ලකි. එය එක් එක් පුද්ගලයාට විවිධ කාර්යයන් හෝ ඉලක්ක කරා යාමට විවිධ ප්‍රමාණයෙන් බලපාතු ලබයි.

> "යම් අවශ්‍යතාවක් පැනනැගී එය සපුරාලනු සඳහා යම් ක්‍රියාකාරිත්වයකට තුඩුදෙන මනෝකායික නොහොත් අභ්‍යන්තර ක්‍රියාවලිය වේ."
>
> *(Lowell, K.)*

> "කිසියම් ප්‍රතිඵලයක් ලබා ගැනීමට පුද්ගලයන් යොමු කරවන, උසිගන්වන ප්‍රවණතාවකි."
>
> *(Akinson, J.W.)*

"කිසියම් ක්‍රියාවකට පෙරටුව යමින් එම ක්‍රියාව තීරණය කරන ආශාව එහි චාලක බලවේගය නැතහොත් ප්‍රබෝධකය පෙළඹවීම වශයෙන් හැඳින්වේ" *(Sali)*

"පෙළඹවීම වූකලී ඉගෙන ගන්නාගේ අභ්‍යන්තර ශක්තීන් හෝ අවශ්‍යතා ඔහුගේ පරිසරයේ ඇති සාරම්මන වස්තූන් වෙත යොමු කරන ක්‍රියාකාරිත්වයකි." *(Blair, G.M.& Others)*

ඉහත සියලු අර්ථසීමනයන් දෙස බැලීමේදී අභිප්‍රේරණය යනු මානසික ක්‍රියාවලියක් බවත් එය පුද්ගලයා අභ්‍යන්තරයෙන් හටගන්නා බවත් ඒ සඳහා යම්කිසි අවශ්‍යතාවක් පුද්ගලයාට බාහිර පරිසරයේ ඇති කරවන බවත් පැහැදිලිය. අභිප්‍රේරණය කිසියම් කාර්යයකට පෙරටුව ගමන් ගන්නා මානසික ස්වභාවයක් බව ද පැහැදිලිය. ඒ අනුව අභිප්‍රේරණය යන සංකල්පය වැදගත් වන්නේ යම්කිසි කාර්යයක් හෝ අරමුණක් ඉටුකර ගැනිමට තමා අභ්‍යන්තරයෙන් ම ඇතිවන නොනිත් ආශාවක් වන නිසාය. අඩු උද්වේගකර අවස්ථාවලදී පවා වැඩි ඵලාදායිතාවක් අත්කර ගනු ලබන්නේ අභිප්‍රේරණය මඟිනි. තමා ප්‍රිය නොකරන කාර්යයන්හිදීත් යම් ඵලදායීත්වයක් පවත්වාගෙන යා හැක්කේ ද, ඉච්ඡාභංගමය බාහිර පීඩාකාරී අවස්ථාවකදී වුව ද එය යටපත් කරගෙන උද්යෝගිමත්ව කටයුතු කිරීම් හැකියාව ලැබෙන්නේද අභිප්‍රේරණය හෙවත් පෙළඹීමේ ගුණාංගය නිසා වේ.[2]

අරමුණක් ඉටුකර ගැනීමට තමා අභ්‍යන්තරයෙන් ම හටගන්නා මානසික අවශ්‍යතාවන් නිසා අභිප්‍රේරණය ඒ ඒ පුද්ගලයා තුළ ම හටගන්නා ඔහුටම සුවිශේෂී අවශ්‍යතාවකි. ඊට හේතුව එක් එක් පුද්ගලයාගේ කායික, මානසික හා සමාජීය අවශ්‍යතා වෙනස් වන නිසාවෙනි. එම අවශ්‍යතා වෙතට පුද්ගලයා මෙහෙයවන ගාමක බලවේගයක් ලෙස අභිප්‍රේරණය දැක්විය හැකිය.




අධ්‍යාපනය යන සංකල්පය සියලු මානව චර්යාවන්ට අදාළ වේ. සෑම පුද්ගලයෙකුම යම්කිසි අධ්‍යාපනික කාර්යයක නිරන්තරව නිරත වේ. එය විධිමත් අවිධිමත් හෝ නොවිධිමත් අධ්‍යාපනයක් විය හැකිය. ඉහත සෑම අධ්‍යාපනයක්ම පුද්ගල සාර්ථකත්වය සඳහා ඉවහල් වේ. යටකී අධ්‍යාපනයේ සාර්ථකත්වය සඳහා අභිප්‍රේරණය නැවත ඉවහල් වේ.

අභිප්‍රේරණය මනෝවිද්‍යාත්මක ක්‍රියාවලියක් ලෙස සැලකිමේදී එය ප්‍රධාන සංරචක තුනක් ඔස්සේ මෙසේ දැක්විය හැකිය.[3]

1. චර්යාවේ ආරම්භය
2. චර්යාවේ ඉලක්කය
3. චර්යාවේ අවසානය

ඒ අනුව අභිප්‍රේරණය ඉහත කරුණු තුන ඔස්සේ ක්‍රියාවලියක් ලෙස රූප සටහනකින් මෙසේ දැක්විය හැකිය.




අභිප්‍රේරණ චක්‍රය[4]

මෙය චක්‍රයක් ලෙස ක්‍රියාත්මක වීමෙන් පැහැදිලි වන්නේ නිෂ්ඨාවෙන් පසු නැවත ආරම්භ විය හැකි බවයි. එකම චර්යාව නැවත නැවත කිරීමට අභිප්‍රේරණය ඉවහල් වේ. එසේ නැවත නැවත කිරීමෙන් තෘප්තියක් ලබන්නේ තාවකාලිකවය. එම තෘප්තිය නැවත ලබා ගැනීමට නැවත නැවතත් අදාළ කාර්යයට යොමු වේ. පරිපූර්ණ තෘප්තියක් ලැබේ නම් අලුත් ඉලක්කයක් කරා යොමු වෙයි. අභිප්‍රේරණ න්‍යාය මගින් චර්යාවේ ආරම්භය (Initiation) එහි දිශාව (Direction) හෝ පාලනය හා නැවතීම (Cessation) විමසා බලයි.[5] යම්කිසි චර්යාවක් සිදු කළ යුතු දිශාව හෙවත් ඉලක්කය හඳුනාගෙන ඒ වෙතම ගමන් කිරීම මෙයින් සිදුවේ. එසේ ම චර්යාව අවසන් වන්නේ කුමන තැනකින්ද යන්න තීරණය කරයි. ඒ අනුව පුද්ගල ක්‍රියාකාරිත්වයේ සියලු අංශයන් කෙරෙහි යොමු වීමක් අභිප්‍රේරණය තුළ දැකිය හැකිය. අධ්‍යාපනය තුළද අභිප්‍රේරණය අනිවාර්යයෙන්ම වැදගත් මානසික සාධකයකි.

"අභිප්‍රේරණය රහිත ජීවියා අක්‍රිය (Passive) වේ. කිසිදු ක්‍රියාවක් සිදු නොකරයි. ඔහු හාත්පස තොරතුරු නොසොයයි.[6]

ඉහත අදහස අනුව සෑම ජීවියෙකුටම ක්‍රියාකාරී වීමට අභිප්‍රේරණය අවශ්‍ය වේ. එහිදී ක්‍රියාකාරිත්වය විවිධ වන්නේ එකිනෙකාගේ අභිප්‍රේරණය සිදුවන දිශාවන් වෙනස් වන නිසාය. අධ්‍යාපනයේදී ජීවියා තුළ මෙම ක්‍රියාකාරී ස්වභාවය තිබීම ඉතා වැදගත් වේ. අධ්‍යාපනික ඉලක්ක කරා ඔහු රැගෙන යාමට මනා පිටුවහලක් එමගින් ලැබේ. පෙළඹවීම යන්න පුද්ගලයාගේ ජීවිත කාලය පුරාම රඳා පවතින වෙනස් වෙමින් ක්‍රියාත්මක වන, පුද්ගලයා විවිධ චර්යාවන්ට යොමු කරන මානසික බලවේගයක් ලෙස හැඳින්විය හැකිය.[7] පෙළඹවීම ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.

1. අභ්‍යන්තර පෙළඹවීම
2. බාහිර පෙළඹවීම



අභ්‍යන්තර පෙළඹවීම යනු මානසික වෙනස්වීම්, මානසික ආවේග, උනන්දුව, කැමැත්ත, රුචිය, ආශාව, බඩගින්න, පිපාසය, ලිංගිකත්වය වැනි අවශ්‍යතා වේ. බාහිර පෙළඹවීම යනු පුද්ගලයාගේ හැසිරීම් රටාව මෙහෙයවන අරමුණු හෝ බාහිර ප්‍රබෝධක වන සහතික, උපාධිය, ඩිප්ලෝමා, රැකියාවේ උසස්වීම්, වැටුප් වැඩිවීම ආදිය වේ.[8]

ප්‍රාථමික ප්‍රේරණ මිනිසාගේ ජීව විද්‍යාත්මක පැවැත්ම සඳහා අවශ්‍ය වේ. ලිංගිකත්වය එසේ නොවුණ ද ජීවයේ පැවැත්ම සඳහා අවශ්‍ය වේ. කෙසේ වෙතත් ප්‍රාථමික ප්‍රේරණ පාලනය කෙරෙන පොදු සාධක සත්වයාගේ අභ්‍යන්තර ඉන්ද්‍රියයන් හා සම්බන්ධ බව මනෝවිද්‍යාඥයින්ගේ මතයයි. එහිදී රුධිරයේ ඇති රසායනික සංයුතින්, හයිපොතැලමස ග්‍රන්ථියේ ක්‍රියාකාරිත්වය, ශරීරයේ රුධිර ප්ලාස්මවල ඇතිවන ඌණතාවන් හා හෝමෝන ක්‍රියාකාරිත්වය ආදි සාධක ප්‍රාථමික ප්‍රේරණ ඉටුකර ගැනීමට ක්‍රියාත්මක වේ.[9]

ද්විතීයික ප්‍රේරණ සමාජ ප්‍රේරණ ලෙස ද දැක්විය හැකිය. එනම් සමාජමය අවශ්‍යතා වෙනුවෙන් ක්‍රියාත්මක වන ප්‍රේරණයි. සමාජ අවශ්‍යතා මත ක්‍රියාත්මක වන නිසා ද්විතීයික ප්‍රේරණ එකිනෙකට වෙනස් විය හැකිය. මෙම සමාජ ප්‍රේරණ යටතට, උපාර්ජන අවශ්‍යතා, සාධන අවශ්‍යතාව, අනුබද්ධ අවශ්‍යතාව හා සමාජ අනුමැති අවශ්‍යතාව, හිංසකත්ව අවශ්‍යතාව ආදි අවශ්‍යතා රැසක් ම ඇතුළත් වේ.[10] උපාර්ජන අවශ්‍යතාව යනු පැහැදිලි ප්‍රයෝජනයක් නොමැතිව වුව ද වස්තූන් රැස් කිරීමයි. උදාහරණ ලෙස කුසගින්න නොමැති වුව ද ආහාර රැස් කිරීම දැක්විය හැකිය. සාධන අවශ්‍යතාව යනු කිසියම් කාර්යයක් සාර්ථකව කිරීමට හෝ ජය ගැනීමට ඇතිවන අවශ්‍යතාවයි. අනුබද්ධ අවශ්‍යතාව යනු තවත් පිරිසක් සමඟ අදරය, ප්‍රේමය හා ලෙන්ගතුකම වැනි හැඟීම් පවත්වා ගනිමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවයි. සමාජශීලී වීමේ අවශ්‍යතාව යනු අනුබද්ධතා අවශ්‍යතාවයේම කොටසකි. එනම්, අන් අයගේ ඇසුර පැතීමයි. සමාජ අනුමැතිය ලැබීමේ අවශ්‍යතාව යනු සමාජයේ අනුමැතිය ලැබෙන දේ කිරීමත් නොලැබෙන දේ නොකිරීමත් වේ.

## අධ්‍යාපනය සඳහා අභිප්‍රේරණය යොදාගැනීම

අධ්‍යාපනය සඳහා අභිප්‍රේරණය ඉතා මැනවින් යොදාගත හැකිය. අභිප්‍රේරණය ඉගෙනුමෙහි කෙටසක් බව සොරෙන්සන් (1977) දක්වයි.[11] එය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී උපරිම දක්ෂතාවක් වෙත සිසුවා රැගෙන යාමට අවශ්‍ය බලය හා දිශාව සපයයි. පුද්ගලයා තම මනසේ ඇතිකර ගනු ලබන ප්‍රේරණයන්ට අදාළව සෑම විටකම කටයුතු කරයි. එම ප්‍රේරණයන් ධනාත්මක හෝ ඍණාත්මක විය හැකිය. එහෙත් අධ්‍යාපනයේ දී ශිෂ්‍යයා ධනාත්මක ලෙස අධ්‍යාපනික ඉලක්ක කරා රැගෙන යාමත් නිරුන්දනය කළ යුතු චර්යාවන් ඍණාත්මකව ප්‍රේරණය කිරීමත් කළ යුතුය.

මාස්ලෝගේ පෙළඹීම් න්‍යාය පිළිගන්නා ගුරුවරයෙක් දරුවෙකු බුද්ධිමය කාර්යන්ගේ නිරත වීමට නම් කායික මානසික හා සමාජීය අවශ්‍යතාවන් සන්තර්පණය වී තිබිය යුතු යැයි පිළිගනියි.[12] ඒ අනුව අධ්‍යාපනික සාධනය මැනවින් ඉටු වීම සඳහා ළමා සංවර්ධනය ද වැදගත් වේ. අධ්‍යාපනික ඉලක්ක කරා සිසුන් යොමු කිරීමේදී ගුරුවරුන් හා දෙමාපියන් ප්‍රමුඛ සියලු ප්‍රජාව ළමා සංවර්ධනයට ද අවධානය යොමු කිරීමෙන් වඩාත් ඵලදායී තත්ත්වයකට අධ්‍යාපනය පත් කළ හැකිය. ගුරුවරයාගේ එක් නිෂේධාත්මක ප්‍රකාශයක් ශිෂ්‍යයෙකුගේ මුළු ජීවිත කාලයටම බලපෑමට ඉඩ ඇත.[13] ඒ අනුව අධ්‍යාපන ක්‍රියාවලියේදී ගුරුවරයෙකු කොතරම් සැලකිලිමත් විය යුතු ද යන්න සිතිය යුතුය. ඒ ආකාරයටම ශිෂ්‍යයාට ධනාත්මක ලෙස ලැබෙන ප්‍රේරණයන් නිසා ධනාත්මක වර්ධනයක් සිසුන් තුළ ඇති කළ හැකිය. "සියලු මනුෂ්‍යයෝම ස්වභාවයෙන්ම දැනුම ලබා ගැනීමට කැමති වෙති" යනුවෙන් ඇරිස්ටෝටල් තම Metaphysics නැමති ග්‍රන්ථයේ දක්වන අදහසට අනුව සියලු දෙනා දැනුම ලැබීමට කැමති නම් ඉගැන්වීමෙන් ද එම කාර්යය ම සිදු කරන බැවින් එය වඩාත් පහසු වනු ඇත.



ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුන් ඊට පෙළඹවාගැනීමට ගුරුවරයෙකුගේ කාර්යභාරය මෙසේ දක්විය හැකිය.

1. පාඩමට අදාළ අවසාන සාධනීය ඉලක්ක පැහැදිලිව සිසුන්ට ප්‍රකාශ කිරීම
2. අවශ්‍ය සෑම විටකම සිසුන්ට වාචික ප්‍රසංසා ලබාදීම
3. පරීක්ෂණ ලකුණු අදාළ මට්ටමටම අනුව ලබාදීම
4. සිසුන්ගේ බුද්ධි කලම්බනය, කුතුහලය ඇතිකිරීම
5. සිසුන්ට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම
6. ළමයින්ගේ රුචිය වර්ධනය කිරීම
7. ළමයින් ජීවත්වන පරිසරයේ නිදසුන් දැක්වීම
8. ඉගෙන ගන්නා සංකල්ප හා න්‍යායයන් දෛනික ජීවිතයට සම්බන්ධ කර පෙන්වීම.
9. හැකි සෑම විටකදීම කලින් උගත් දේ සමග නව පාඩම සම්බන්ධ කිරීම.
10. හැකි සෑම විටකම ක්‍රියාකාරී අත්දැකීම් මඟින් ඉගැන්වීම.
11. එකකට එකක් තරඟකාරී වන පෙළඹීම් ක්‍රම අතර තරඟකාරී ආකර්ෂණය අඩු කිරීම.
12. අධි ක්‍රියාකාරීත්වය නිසා ළමයින්ට විය හැකි අප්‍රසන්න ප්‍රතිඵල තේරුම් කිරීම
13. පෙළඹවීම් ක්‍රම අනුගමනය කිරීමට පෙර පාසලේ සංස්කෘතික වාතාවරණය අවබෝධ කර ගැනීම.
14. ගුරු ශිෂ්‍ය ගෞරවය රැකෙන පරිදි පෙළඹවීම් ක්‍රම අනුගමනය කිරීම.[14]

අධ්‍යාපනයට පෙළඹවිය හැකි සාධක අතර සාධනීය ඉලක්ක තිබීම ඉතා වැදගත්ය. එවිට සිසුවා කුඩා කුඩා අරමුණු හඳුනාගෙන ඒ ඔස්සේ තමා ගමන් කළ යුතු මාවත හඳුනාගනියි. ඉලක්ක ලබා නොදුන් විට තමා ඉගෙන ගන්නේ කුමක් සඳහා ද යන්න අවබෝධයක් නැත. එවිට මතක තබා ගැනීම, ප්‍රායෝගිකව ජීවිතයට යොදා ගැනීම වැනි කටයුතුවලදී සිසුවා අපහසුතාවය ට පත් වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුන්ට අවශ්‍ය සෑම විටකදීම වාචික ප්‍රසංසා ලබා දීම ඉතා වැදගත්ය. ළමයා යනු නොමේරූ කායික හා මානසික හැකියාවකින් යුතු තැනැත්තෙකි. ශිෂ්‍යයින්ගේ ස්වසංකල්පය ඉහළ නැංවෙන්නේ අන් අයගේ අගය කිරීම් මතය. එහිදී ගුරුවරයකු විසින් ලබා දෙන වාචික ප්‍රසංසාව සිසුවාගේ ස්වසංකල්පය ඉහළ නැංවීමට ඉතා වැදගත්ය. තමා අන් අය අතර සිටින ස්ථානය සිසුවා එයින් අවබෝධ කරගනියි. එහි දෙවැනි වැදගත් කාරණය වන්නේ අගය කිරීමට ලොව සියලු මිනිසුන්ම කැමති වීමයි. තමා අගය කරනු දැකීමෙන් ඊට අදාළ කාරණය වඩ වඩාත් හොඳින් කිරීමට පෙළඹෙන අතර වෙනත් කටයුතු ද හොඳින් ඉටුකර අගය කිරීම් මඟින් සියුම් සතුටක් ලබයි. මෙම ලක්ෂණය ළමා කාලයේ වැඩියෙන් දැකිය හැකිය. එම නෛසර්ගික ලක්ෂණය අධ්‍යාපනික කාර්යයේදී යොදා ගැනීමට ගුරුවරුන් උන්නඳු විය යුතුය.

විවිධ පරීක්ෂණ පවත්වා ලකුණු ලබාදීම මගින් ද සිදුකරන්නේ තමාගේ සාධන මට්ටම ඒ ඒ සිසුන්ට දැන ගැනීමට සැලසීමත් එයින් අගය කිරීමත්ය. වැඩි සාධන මට්ටමක් හිමි සිසුන් තමාගේ ස්ථානය රැක ගැනීමට උත්සාහ ගන්නා අතර අඩු සාධනයක් පෙන්නුම් කරන සිසුන් තමා ඉහළට යා යුතු මට්ටම නිශ්චිත ලෙස දැන ගනියි. එහිදී ගුරුවරයා වැඩියෙන්ම සැලකිලිමත් විය යුත්තේ සිසුවාගේ අදාළ මට්ටමට අනුව ම ලකුණු පැවරීමටයි. අඩු ලකුණක් හිමි සිසුවෙකුට වැඩි ලකුණක් දීමෙන් එම සිසුවා තමා පිළිබඳ අධිතක්සේරුවක් ද අඩු ලකුණක් දීමෙන් අවතක්සේරුවක් ද ඇති කර ගනියි. ඒ දෙයංශයම අධ්‍යාපනයේදී හානිදායකය.

සිසුන් තුළ බුද්ධි කලම්බනය හා කුතුහලය ඇති කිරීම ද අභිප්‍රේරණ ක්‍රියාවලියට අයත් කාර්යයකි. බුද්ධි කලම්භනයෙන් සිසුවා තර්කානුකූලව සිතීමටත් නිදහසේ සිතීමටත් යොමු වේ. කුතුහලය නිසා ඉන් පසු සිදුවන්නේ කුමක් ද යන්න නිරන්තරව විමසයි. ළමා කාලය ද දැඩි කුතුහලයෙන් යුතු කාලයක් වන නිසා අධ්‍යාපනයෙන් ද එම මානසික ස්වභාවයට අනුගතව



අධ්‍යාපනය ලබා දීමෙන් අධ්‍යාපනික ක්‍රියාවලිය සාර්ථක මාවතකට යොමුකර ගත හැකිය.

සිසුන්ට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීම ද පෙළඹවීමට වැදගත් වේ. තමාගේ අදහස ප්‍රකාශ කිරීමෙන් සිසුවා තුළ පවතින ආක්‍රමණශීලි ක්‍රියාත්මක වේ. ඒ තුළින් තමා අන් අය අතර වැඩි හැකියාවක් ඇති බව සිසුවාට ඒත්තුගැන්වේ. එවැනි අදහස් ප්‍රකාශ කිරීමකින් පසු ගුරුවරයාගේ හා අන් සිසුන්ගේ ඇගයීම ද සිසුවාට ලැබේ. එයින් යම්කිසි උද්දාමයකට පත්වීමක් ද සිදු වේ. එම හැඟීම වර්ධනය වෙත්ම සිසුවා ඊළඟ දිනයේ පාඩමට පෙර සූදානමක් ඇති කර ගනියි. ඊට හේතුව පෙර සඳහන් කළ පරිදි අගය කිරීමට ලක්වීමට ඇති කැමැත්තයි.

ළමයින්ගේ රුචිය වර්ධනය කිරීම ද සිසුවා අභිප්‍රේරණයට මැනවින් යොදාගත හැකිය. මෙහිදී රුචිය යනු ඉගෙනිමට හා දැනගැනිමට ඇති කැමැත්තයි. ළමයින්ගේ රුචියවර්ධනය කිරීම ක්‍රමානුකූලව සිදු කළ යුතුය. එහිදී පියවරෙන් පියවර ඉදිරියට සිසුවා රැගෙන යා යුතුය. අධ්‍යාපනයේදී සිසුවාට ගමන් කළ නොහැකි දුරක් ඉදිරියට ගෙන යාමට උත්සාහ කළ විට එවැනි බුද්ධිමය හැකියාවක් නැති සිසුන් අධෛර්යයට පත් වේ. තමාට හැකි ප්‍රමාණය කළ පසු ඉගෙනීමට ඇති රුචිය වර්ධනය වේ. එවිට කුඩා කුඩා කොටස් ඉගෙනීමෙන් සාර්ථකත්වයට ද පත් වේ.

ළමයින් ජීවත්වන පරිසරයේ නිදසුන් දක්වීම ද සිසුන් අභිප්‍රේරණය කිරීමට හොදම ක්‍රමයකි. ජීවත් වන පරිසරය කාටත් හුරු පුරුදුය. එම පරිසරයේ සිද්ධි උදාහරණ ලෙස ගැනීමෙන් ඉගෙනීම තමාට ආගන්තුක දෙයක් නොව සාමාන්‍ය දෙයක් බව සිසුවාට හැඟී යයි. නිදසුන් තමා දන්නා ඒවා වීම නිසා එම නිදසුන් මඟින් හොඳින් තේරුම් ගැනීමට හා අවබෝධ කරගැනීමට හැකියාවක් සිසුන්ට ලැබේ. ඒ අනුව ජීවන අත්දැකීම්වලින් පොහොසත් වීම ද අධ්‍යාපනික අභිප්‍රේරණයට හේතු වන බව සිතිය යුතුය.

ඉගෙන ගන්නා සංකල්ප හා න්‍යායයන් දෛනික ජීවිතයට සම්බන්ධකර පෙන්වීම ද ඉහත කරුණ හා මනා සම්බන්ධතාවක් පෙන්වයි. තමා ඉගෙන ගන්නා දෙය එදිනෙදා ජීවිතයේ ගැටලු විසඳීමට හා භාවිතයට මග පෙන්වීමක් ගුරුවරයා විසින් කළ යුතුය. න්‍යායන්, න්‍යායන් ලෙස ම ඉගෙනීමෙන් ප්‍රායෝගික භාවිතයට හුරුවක් නොලබන අතර ඒවා සැබෑ ජීවිතයේදී භාවිත වන ආකාරය ද හඳුනා නොගනියි. අධ්‍යාපනය භාවිතය සඳහා වන බව උපයෝගීතාවාදී අධ්‍යාපන දර්ශනයෙන් පැහැදිලි වේ. ඒ අනුව අධ්‍යාපනය භාවිතයට ගත හැකි ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීමෙන් සිසුන් අධ්‍යාපනය කෙරෙහි අභිප්‍රේරණය කළ හැකිය.

හැකි සෑම විටකදීම කලින් උගත් දේ සමග නව පාඩම සම්බන්ධවීම සිදුවිය යුතුය. සර්පිලාකාර විෂයමාලාව අනුව පැරණි දැනුම මත නව දැනුම ගොඩනැංවෙන බව පැහැදිලිය. එසේම මනසේ ඇති මනෝරටා ගොඩනැගීමටද එය පහසුවක් වේ. දරුවා තමා හුරුපුරුදු ක්‍රියාකාරකම් පිළිබඳ මනසේ සටහන් කරගනු ලබන "දැනුම" වශයෙන් මෙම රටා ව්‍යූහ හැඳින්විය හැකිය. පියාජේගේ වාග්මාලාව අනුව ඒවා ස්කීමා (Schema) යනුවෙන් හැඳින්වේ.[15]

හැකි සෑම විටකම ක්‍රියාකාරී අත්දැකීම් මගින් ඉගැන්වීම මහත්මා ගාන්ධිතුමාගේ හා සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමාගේ අධ්‍යාපන දර්ශනයන් සමඟ සාකල්‍යයෙන්ම ගැලපෙන්නකි.[16] ක්‍රියාකාරීත්වය බුද්ධිමය හැකියාව වර්ධනයට මෙන්ම නව දැනුම හා සංකල්ප මනසේ ඇති කිරීමට සමත් දෙයකි. ඒ අනුව වැඩෙමින් පවතින දරුවාගේ මනසේ ස්වභාවය ද මනා ක්‍රියාකාරී බවයි. ළමා කාලයේ දරුවන්ගේ ස්වභාවය ද ක්‍රියාකාරී වීමයි. ඒ අනුව ළමා සංවර්ධනයට අදාළව ක්‍රියාකාරීව ඉගැන්වීම ද සිසුවා කැමති ලෙස හැසිරීමට දීමකි. නමුත් එහි යම්කිසි පාලනයක් ඇත. එය ගුරුවරයා විසින් කරනු ලබන පාලනයකි. නමුත් වැඩි අවස්ථාව ක්‍රියාකාරීත්වයට ලබාදීමෙන් වඩා හොඳ ඉගෙනුම් අත්දැකීම් සජීවීව ලබා ගැනීමට හැකියාව ලැබෙන නිසා සිසුවා වඩා හොඳින් අභිප්‍රේරණය වේ.



එකකට එකක් තරගකාරී වන පෙළඹීම් ක්‍රම අතර තරඟකාරී ආකර්ෂණය අඩු කිරීම කළ යුතුය. තරඟකාරීත්වය වැඩිවීමෙන් ආක්‍රමණශීලී ආශ්‍රය වැඩි වේ. එය ඇතැම් විට හානිකර විය හැකිය. එසේ නොවීමට පෙළඹවීම් ක්‍රම තිබුණද එවා අතර තරඟකාරීත්වය අඩු කිරීම වඩා වැදගත් වේ.

අධික්‍රියාකාරීත්වය නිසා ළමයින්ට විය හැකි අප්‍රසන්න ප්‍රතිඵල අවම කිරීමට කටයුතු කළ යුතුය. එහිදී අධික්‍රියාකාරී වීමෙන් යාන්ත්‍රික බව ඇතිවිය හැකිය. මනසට දරාගත නොහැකි පීඩනයන් නිසා මානසික ගැටලු හා අසහනකාරී තත්ත්වයන් උද්ගත විය හැකිය. ඒ නිසා අධ්‍යාපනික අභිප්‍රේරණයේදී ඉහත කරුණු පිළිබඳ අවධානය යොමුවීමද වැදගත් වේ.

## සමාලෝචනය

අධ්‍යාපනයේදී අභිප්‍රේරණය මනෝවිද්‍යාත්මක සංකල්පයක් ලෙස ගුරු ශිෂ්‍ය දෙපාර්ශවයට ම වැදගත් වේ. අභිප්‍රේරණය සඳහා විවිධ ක්‍රම අනුගමනය කළ හැකිය. එහිදී ළමා මනසට හානිකර නොවන ලෙස අභිප්‍රේරණය කිරීමට වගබලා ගත යුතුය. එය ළමා මනසේ ඇතුළත ඇති ශක්තිය පිටතට ඇද ගැනීමකි. එසේත් නැතිනම් ස්වයං ක්‍රියාකාරීත්වය සඳහා මූලික පසුබිම සකස් කිරීමකි. සැබෑ අධ්‍යාපනයේදී සිදුවිය යුත්තේ ඒ ඒ පුද්ගලයාගේ මානව විභව්‍යතා හඳුනාගෙන එම විභව්‍යතාවලට අනුව ඉලක්ක කරා යාමට අවැසි මානසික පරිසරය සිසුවා තුළ ගොඩනැගීමය. අභිප්‍රේරණය මනා ලෙස ප්‍රයෝජනයට ගන්නා ගුරුවරයෙකුට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඉතා රසවත් හා සතුටුදායක අත්දැකීමකි.

## ආන්තික සටහන්


1. ජාතික අධ්‍යාපන ආයතනය, 2010, අධ්‍යාපන මනෝවිද්‍යාව අත්පොත, මහරගම, පිටුව 82,
2. අබේපාල, රෝලන්ඩ්, 2010, අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම, කොට්ටාව, සාර ප්‍රකාශන. පිටුව 273
3. සිල්වා, පී. ජී. ජී. 1993, මනෝවිද්‍යාව හැඳින්වීමක්, මරදාන, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, පිටුව 88.
4. අබේපාල, රෝලන්ඩ්, 2010, අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම, කොට්ටාව, සාර ප්‍රකාශන, පිටුව 388.
5. Defrancois, G.R., 1985, Psychology for teaching. California, Wadsworth publishing, p. 308
6. Zimbardo, P.G., 1985, Psychology and Life, London, Scott forestan and Company, p 264.
7. අබේපාල, රෝලන්ඩ්, 2010, අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම, කොට්ටාව, සාර ප්‍රකාශන. පිටුව 389
8. එම,පිටුව 390.
9. අතුකෝරාල, දයා රෝහණ, අතුකෝරාල, හේළි නිමලා, 2005, පානදුර, ශික්ෂා මන්දිර ප්‍රකාශන, පිටුව 326.
10. එම, පිටුව 329.
11. ජිතේන්ද්‍ර මොහාන්, 2013, පන්තිකාමරය තුළ අභිප්‍රේරණය, අධ්‍යාපන මනෝවිද්‍යාව, බත්තරමුල්ල, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, පිටුව 333
12. අධ්‍යාපන මනෝවිද්‍යාව, වෙළුම 11, 1997, MEE/GTZ ව්‍යාපෘතිය - අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, පිටුව 83
13. කාරියවසම් සී.,2016, නව අධ්‍යාපන මූලධර්ම, කොට්ටාව, සාර ප්‍රකාශන. පිටුව 129
14. අබේපාල, රෝලන්ඩ්, 2010, අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම, කොට්ටාව, සාර ප්‍රකාශන. පිටුව 403
15. අබේපාල, රෝලන්ඩ්, 2010, අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම, කොට්ටාව, සාර ප්‍රකාශන. පිටුව 125
16. කාරියවසම්. සී., 1998, කාලීන අධ්‍යාපනඥයෝ, බොරැල්ල, ශිකෂා මන්දිර ප්‍රකාශන, පිටුව 103.